# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2326/41 - 2023 අප්‍රේල් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2023.04.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 අප්‍රේල් මස 06 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි **"2023 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම රෙගුලාසි 2023 ජූනි මස 01 වැනි දින සිට බලාත්මක වේ.

3. 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි, මෙමගින් සංශෝධනය කෙරේ.

4. ඉහත සඳහන් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල **IV** වන උපලේඛනයට පහත විස්තර කර ඇති භාණ්ඩ හා ඒවාට අනුරූප සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.


1A - PG 6293 — 376 (2023/04)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | I තීරුව<br>ශීර්ෂ අංකය | II තීරුව<br>සංයෝජිත<br>වර්ගීකරණ<br>සංකේතය | | III තීරුව<br>විස්තරය | IV තීරුව<br>ආනයන<br>තහනම **(B)** |
|---|---|---|---|---|---|
| **10** | **39.17** | | | ප්ලාස්ටික් වලින් තැනූ, පයිප්ප සහ හෝස් පයිප්ප සහ ඒ සඳහා වූ වැද්දුම් (උදාහරණ වශයෙන් සන්ධි, එල්බෝ, පලංජි) | |
| | | | - | අනෙකුත් නළ, පයිප්ප සහ හෝස් පයිප්ප : | |
| | | 3917.32 | -- | වෙනත් ද්‍රව්‍ය වර්ග වලින් ශක්තිමත් නොකළා වූ හෝ අන් විධියකින් ඒවා සමග සම්බන්ධ නොකළා වූ, සවිකිරීම් රහිතව, අනෙකුත් (එක් වරක් පමණක් භාවිත කරන බීම බට පමණි) | **B** |
| | | | | | |
| **11** | **39.24** | | | ප්ලාස්ටික් වර්ග වලින් නිමකළ මේස උපකරණ, මුළුතැන්ගෙයි උපකරණ, අනෙකුත් ගෘහ උපකරණ සහ සනීපාරක්ෂක හෝ ප්‍රසාදිත භාණ්ඩ. | |
| | | 3924.10 | - | මේස උපකරණ මුළුතැන්ගෙයි උපකරණ | |
| | | 3924.10.90 | --- | අනෙකුත් ප්ලාස්ටික් වලින්<br>(එක් වරක් පමණක් භාවිත කරන මිශ්‍ර කිරීමට ගන්නා උපකරණ, එක් වරක් පමණක් භාවිත කරන පිඟන්, එක් වරක් පමණක් භාවිත කරන කෝප්ප (යෝගට් කෝප්ප හැර), එක් වරක් පමණක් භාවිත කරන හැඳි, එක් වරක් පමණක් භාවිත කරන ගෑරුප්පු, එක් වරක් පමණක් භාවිත කරන පිහි සහ ඉඳි ආප්ප තට්ටු පමණි) | **B** |
| | | | | | |
| **12** | **67.02** | | | කෘත්‍රිම මල්, පත්‍ර සහ පළතුරු සහ ඒවායේ කොටස්; කෘත්‍රිම මල්, පත්‍ර හෝ පළතුරුවලින් තැනූ භාණ්ඩ | |
| | | 6702.10 | - | ප්ලාස්ටික් වලින් තැනූ (මල්මාලා පමණි) | **B** |

5. 2023 ජූනි මස 01 දින හෝ ඊට පසු ශ්‍රී ලංකාවේ ඕනෑම වරායකට/ ගුවන් තොටුපළකට ළඟා වන ඉහත රෙගුලාසි අංක 4 හි නිශ්චිතව දක්වා ඇති ඕනෑම භාණ්ඩයක්, එම භාණ්ඩ ළඟා වූ දින සිට දින තිහක් (30) ඇතුළත අපනයනය කරනු ලැබූ රටට ප්‍රති-අපනයනය කළ යුතුය.

6. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, වාණිජ බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

EOG 04-0090

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.